## අහෝ මනමේ කුමරුනි

දයා මානෙල් සෙනෙවිරත්න
සමස්ථ ලංකා කවි සම්මේලනයේ සහ අ ත ක ස



සතුට මුවගට ගෙනෙන විලසින කරපු හාසය හැමට    රිසිලෙස
නිහතමානිව හැමදෙනා වෙත කාරුණික බව පුදපු    ගරු ලෙස
වේදිකාවට ගැලපෙනායුරු රඟපු ඔබ නළු රජකු    වනලෙස
'විජය නන්දසිරි' කලාකරුවනි ඔබව අගැයුවේ සියළු    දසදෙස

නළුවකු පියකු සැමියකු ලෙස මිහි    තලයේ
පෙනී සිටියේ සුන්දර ලෙස  මෙම    භවයේ
නොසිතුව පරිදි ඔබ අප අතහැර ගිය    සැටියේ
නැවතත් අප අතරම ඉපදෙනු මතු    භවයේ

සත් භාවයෙන් පිරි මිනිසුන් හිඟ    රටක
මෙත් කරුණාව පෑ ඔබ සැඟවුනෙ    සැනෙක
සිත් සැනසෙන්නෙ කෙලෙසද අප සිතු    විටෙක
මෙත් බුදු දැක නිවන් දකිනුය මතු    දිනත

නිහතමානි අවිහින්සක    සිනාවට
රසිකයො ප්‍රියකළා ඔබ පෑ    හාසයට
ඔබ නැති හිඩැස පුරවන්නට    කිසිම විට
කා හට හැකිවේද කුකුසකි මගෙ    සිතට

හැම හද තුලම නිරතුරු ඔබ රඟ    පෑවා
ඒ හාසයෙන් හැමදෙන කුල්මත්    වූවා
දහම අනුව විය යුතු දෙය සිදු    වූවා
විජය ඔබට නිවනෙහි මග හිමි    වේවා !

## ලක් මැණියෙනි ඔබ අද ඇඩු කදුලින්ද?

ජයසේන කොඩිතුවක්කු
වත්තල - ශ්‍රී ලංකා

පෙර රජ දවස රට එක්සත් කරපු    හැටී
තුන් සිංහලය සරු සාරව තිබුනු    හැටී
සාමය සතුට රට වැසියන් විදපු    හැටී
දරුවෙනි ඔබට සිහිපත් කරදීම    වටී

ආගම දහම බැබළුනි පුර සඳ    සේම
පැවතුනි සිහල තේජස දිනිසුරු    සේම
ගුණමකු වුනේනැහැ මිනිසුන් හැම    විටම
නීතිය ගරු කළා දැන යුතු අයුතු    කම

සීගිරි ලෙනේ හෙලිවන හෙළ    කලාවයි
අව්කන පිලිමයෙන් උතුරන ගුණ    සිසිලයි
යෝද ඇලේ දියවර ලොව මවිත    කරයි
පැරකුම් සමුදුරට අපෙ මුළු රටම    ණයයි

පන්සිය පහේ සිට හතලිස් අට    දක්වා
පර දේසක්කාර පාලනයට නතු    වූවා
හැම සම්පතම උන් හූරා ගෙන    කෑවා
සිහල සිරිත පර සිරිතට බිලි    වූවා

රටට ලැබුනු නිදහස කළයුතුය    අගේ
ලොවට ණය නොවී එඩිතර රටක්    වගේ
හෙටට ඔබින ලෙස සැලසුම් කළොත්    අගේ
මොනවට කියනවද ඒවයෙ නැතිය    අගේ

තට්ටු මාරුවට රජයන්බිහි    වූවා
ඔට්ටු වෙවී එකිනෙකාගෙ දොස්    බැලූවා
කිට්ටු වෙද්දි මැතිවරණය බොරු    කීවා
රට්ටු හැමදාම එකලෙස    රැවටෙව්වා

බොන්නට ජලය නැති ජනයා    කොතරම්ද
ඉන්නට නිවහනක් නැති අය    කොපමනද
කන්නට අහර නැති දරුවන් දැක    නැතිද
බලයට එන අයට මේවා    නොපෙනේද

ගොවිතැන අද කුඩම්මගෙ සැලකිල්ල    ලබයි
අධ්‍යාපනය මුදලට නගරෙට    විතරයි
රැකියා නැතිව තරුණන් සෝ සුසුම්    හෙලයි
තව කොතෙකුත්ද රට තුළ මැසිවිලි    බහුලයි

රට නිසි මගක යොමු වන දින    කවදාද
දරු පරපුරට සරු දිවියක් හිමි    වෙයිද
සිංහල එකම රට ලොව හෙට නැති    වෙයිද
ලක් මැණියෙනි ඔබ අද ඇඩු    කදුලින්ද

## Flowers in the Season

REBECCA FERNANDO

The flowers, the flowers,
They bloom, bloom bloom
Nothing in the world could make them
Gloom, gloom, gloom
The petals they spread,
Leaving no dread,
"Of the outside world" they once said.
In the toughest of times,
They shine, they shine
Moreover, the harmonic bells chime.
Swaying in the wind in peace,
Lowering proud and high with ease,
When the loveliness departs from the stalk,
Long lost as the flowers talk, goodbye season, it's time.

## ඔය ආදරයයි සියල්ලටම වඩා වටින්නේ

තුෂාරි ප්‍රියංගිකා



කිරි ඉද්ද පිපී හිනැහෙන හැටි බලන්න එන්න
නා දල්ල දිගේ බේරෙන පිනිකැට අහුලන්න
සියපතක දිලෙන මුදු ගුණ දෑසක තවරන්න
මගෙ පුංචි දුවේ ගහ කොළ දියවැල් ය බලන්න

නිල් අහස දිගේ පියඹන සියොතුනි මෙහෙ එන්න
කිරි ගොයම පැසී එක කවියක් කියලා යන්න
මහපොළොව හිඳී නොසැළී නුඹලා සනසන්න
මගෙ පුංචි පුතේ පුන් පෝ දා අහස බලන්න

දයා දියෙන් තෙමෙනා හදවතක් තියෙන්න
ආදරයෙන් සොබා දහම දිහා බලන්න
මගෙ පුංචි දරුවනේ වසවිස ගැනත් හිතන්න
ගන අඳුරු රැයට පහනක් සේ රැස් විහිදන්න

පුංචි ලොවක පුංචි එවුන් වගේම ඉන්න
කුරුළු පැටවුනේ පියඹා ලෝකෙ දකින්න
අකුර අකුර එකතු කරලා නැණස වඩන්න
සොඳුරු ලොවක් තැනුමට නම් නුඹලට ඉන්න

නිල් මැණික පරද්දන එළියකි දැනුම කියන්නේ
ඒ එළියෙනි මිනිසත්කම පාට වැටෙන්නේ
කිරි හිනාවකින් කලතා ලෝකෙට කියපන්නේ
ඔය ආදරයයි සියල්ලටම වඩා වටින්නේ



## උපන් දිනේ

ශ්‍යාමා හේවාවිතාරණ
(හයිඩල්බර්ග්)

සත් අවුරුද්දට පා තබනා මගේ    මුණුබුරා
ලෙගෝ කෑලි අතට අරන් දුවයි ගේ    පුරා
අමුණ අමුණ එකින් එකට මවයි සිත්    පුරා
හෙලිකොප්ටර් ප්ලේන් වලින් පිරෙයි ගේ    පුරා

සිව්වන වියට පා තබන මගේ    මිණිබිරි
හරි හුරතල් බස් දොඩනා චූටි    මිණිබිරි
චූටිකමට කවි මුමුණයි සිනා කට    පිරි
ගේ පුරාම දෝර ගලයි සතුට හද    පිරී

ප්ලේන් ෂෝ එකක් කරමු කියන    මුණුබුරා
වරු ගානක් පෙන්න පෙන්න දුවයි    ගේ පුරා
ලොකු වුණාම ඇත්ත ප්ලේන් හදන්නට    කියා
පතන්නම් පුතේ සතුටින් මගේ හද    පුරා

ආච්චිට මම උයලා දෙනවා කියන    මිණබිරි
උයල පිහල ගෙනත් කවයි මගේ    මිණිබිරි
රණ්ඩු වෙලා තරහ වෙලා යනවා    මිණිබිරි
තව ටිකකින් ආයෙත් එයි චූටි    මිණිබිරි

තව වසරක් උදා වුනා ඉන්නට    කාලේ
ඔය දෙන්නගෙ හුරතල් දැක ගෙවෙනවා    කාලේ
ඉගෙන ගන්න හොඳට පුතේ ඉගෙනුම්    කාල
අම්මා ආච්චි සුබ පතනවා හස පිරි    ආලේ

## අසම්

ආශා ඩී පෙරේරා

**පෙර මෙන්ම ,ඔබ සුවෙන්, සතුටින්ද...???**
**ප්‍රේමයත් ,අපි මෙන්ම**
**වියපත්ද...???**
**ඉස්සරම මුණ ගැහුණු දවස් වල**
**වළ දැමූ කදුළු පැස මතකයිද...???**
**ඇත්තටම ඔබ සුවෙන් සතුටින්ද...???**
**වියෝදුක් සෝක ගී**
**නැතිවාට...**
**හිත් මහලු වූවාද**
**රහසේම...**
**ඒ උනත් ඔබ සුවෙන් සතුටින්ද ...???**
**අද පවා මේ අහස් වියන යට**
**සුවහසක් හිත් පෙමින් වෙළෙණු ඇත...**
**අහිමි උව වසන්තය ඔබට මට**
**සිනහසෙමු ලොවට මල් පිපෙනු දැක**